# පොතුවිල්, මුහුදු මහා විහාර පුරාවිද්‍යා ස්ථානයට වර්තමානයේ එල්ල වී ඇති මානව බලපෑම් පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

**සුමනසිරි වාච්චගේ, ගයාන් තරිඳු, තුසිත දිසානායක*, කාංචන ලක්මාල්**

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයන අංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර.

*thusithadisanayaka@gmail.com

ප්‍රමුඛ පද : මුහුදු මහා විහාරය, මානව බලපෑම්, පුරා ස්මාරක, සංහිඳියාව, ජාතික උරුමය

## හැඳින්වීම

විවිධ කාල වකවානුවල දී රෝහණ දේශයේ බලයට පත් රජවරුන්ගේ නායකත්වය හා අනුග්‍රහය මත රෝහණ දේශවාසීන් විසින් ගොඩනගන ලද බෞද්ධාමික ස්ථාන රැසකි. අවුරුදු දහස් ගණනක් තිස්සේ පැවැති ඒ පෞරාණික ස්ථාන 18, 19, 20 යන සියවස් වෙන විට ස්වාභාවික හේතූන් හා අදූරදර්ශී මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අනාරක්ෂිත තත්ත්වයට පත්ව සිදු වූ හානිය විශාල ය. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙන් ම මධ්‍යම සංස්කෘතික අරමුදල ද පුරා ස්මාරක සංරක්ෂණයසඳහා ස්වකීය අවධානය රජරට කෙරෙහි ප්‍රමුඛ ව යොමුකළ හෙයින් විවිධ පුණ්‍යායතන, සමාජ හා සංස්කෘතික සංවර්ධන සමිති සහ භික්ෂූන් වහන්සේලා මෙබඳු පැරණි ඓතිහාසික ස්ථාන සොයා ගෙන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොර ව සංවර්ධනය කිරීමට පෙළඹුණි. පුරාවිද්‍යා ශික්ෂණයකින් වියුක්ත වූ නීත්‍යානුකූල නොවන එම ක්‍රමවේදය නිසා මෙම පුරාවස්තූන්ට සහ ස්මාරකයන්ට වූ හානිය කිව නොහැකි තරම් ය. ඇතැම් පුරා ස්ථානයන් සඳහා එල්ල වූ මානව බලපෑම් ආගමික හා ජාතිවාදී ස්වරූපයක් ගනු ලැබිණි. එවන් එක් ස්ථානයක් ලෙස අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුහුදු මහාවිහාර පුරා පරිශ්‍රය හඳුන්වා දිය හැකි ය. එක් අවස්ථාවක දී එහි පැරණි ප්‍රතිමා ගෘහය සහ උපෝසථාගාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් සංරක්ෂණය කරනු ලැබුව ද ඒවායේ නඩත්තු හා ආරක්ෂා කටයුතු සම්බන්ධයෙන් විධිමත් හා අඛණ්ඩ වැඩ පිළිවෙලක් නොවූයෙන් ඇති වූ හානිකර තත්ත්වය සහ මානව බලපෑම් මගින් වූ හානිකර තත්ත්වය ද බරපතල වූ අතර එය වර්තමානය දක්වා ම විවිධ මුහුණුවරින් යුක්තව ඉදිරියට ගමන් කරනු පෙනෙයි. අපගේ ප්‍රයත්නය වන්නේ මෙකී පුරාවිද්‍යා පරිශ්‍රයට සිදුවී ඇති මානව බලපෑම් පිළිබඳ ව අධ්‍යයනය කිරීම ය.

## ක්‍රමවේදය


අපගේ අධ්‍යයනය සඳහා, ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර අධ්‍යයනය, ක්ෂේත්‍ර සමීක්ෂණය, පුරාවිද්‍යා හා ස්මාරක ගවේෂණය, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා ප්‍රශ්නාවලි ක්‍රමය යනපර්යේෂණ ක්‍රමවේද අනුගමනය කරන ලදී. සාහිත්‍යය මූලාශ්‍ර මඟින් අතීතයේ පැවැති දේශපාලනික පසුතලය, ආගමික හා සංස්කෘතික පසුතලය පිළිබඳව විමසීමට ලක් කෙරුණි. මෙම අධ්‍යයනය ප්‍රදේශය තුළ ජනතාවගෙන් 93%ක් මුස්ලිම් ප්‍රජාව ද, 5% හා 2% පිළිවෙළින් දමිළ හා සිංහල ප්‍රජාව ද ජීවත්වන අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා යන අවස්ථාවන් සඳහා මුස්ලිම් ජනතාවගෙන් වැඩි පිරිසක් සම්බන්ධ කරගැනීමට හැකි විය. මානව බලපෑම පර්යේෂණයෙහි වැදගත් සාධකයක් වන බැවින් සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් දත්ත එක්රැස් කෙරිණ. සම්මුඛ සාකච්ඡා සඳහා පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුහුදු මහා විහාරයට අනුබද්ධිත ග්‍රාමසේවා වසම්හි සාමාන්‍ය ජනතාව, සමහර සේවා ක්‍රියාකාරී සාමාජිකයින්, රාජ්‍ය සේවය වගකිව යුතු පුද්ගලයන් සහ ව්‍යාපාරික ප්‍රජාව ඇතුළත් වන පරිදි තොරතුරු ලබා ගැනුණි. ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය යටතේ වැදගත් ක්‍රියාකාරකමක් වූයේ පුරාවිද්‍යා ස්මාරක ගවේෂණයයි. එමඟින් ප්‍රස්තුත ප්‍රදේශ ස්මාරක වලට සිදු ව තිබෙන හායනකාරක තත්ත්වය, වර්තමානයේ දි ස්මාරක පිහිටීමේ ස්වරූපය දැනට ස්මාරකවලට සිදුව තිබෙන මානව බලපෑම් අධ්‍යයනය කරන ලදී. පුරා පරිශ්‍රයේ ප්‍රධාන පුරා ස්මාරක මිණුම්ගත කිරීම හා සිතියම් ගත කිරීම ද සිදු කරනු ලැබීය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

අප විසින් 2015 සැප්තැම්බර් මස සිදු කළ ගවේෂණයට අනුව වෙරළේ උස් බෑවුම් කොටසේ දාගැබක ශේෂ ද දාගැබට බටහිරින් ගල් කණු සහිත පිළිම ගෙය හි ගොඩනැගිලි ශේෂ ද දැකිය හැකි විය. එම ගොඩනැගිල්ලට දකුණු දෙසින් හඳුනා නොගත් ගොඩනැගිල්ලකි. ගල් කණු කිහිපයක් මෙහි ශේෂව පවතී. එයට පිටුපසින් දැනට වර්තමාන භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කරන ආවාස ගෙය, ධර්ම ශාලාව, බෝධි ප්‍රාකාරයකින් යුක්ත බෝධීන් වහන්සේ ද දැකගත හැකිය. නැගෙනහිර මුහුදු සීමාව ආසන්නව වැලි වැටි වලින් යට වී ඇති තවත් ගල්කණු කිහිපයක ශේෂ කොටස් ද හඳුනාගත හැකි ය. මෙම පුරා ස්මාරක අතරින් පැරණි පිළිමගෙය වැදගත් වේ. මුහුදු මහා විහාරයේ ස්මාරක අතර සංරක්ෂණ කටයුතු සිදුකර ඇති එකම ස්මාරකය මෙය වේ. විවිධ බාධක හා අභියෝග මෙම විහාරයට එල්ල වුව ද දැනට මද වශයෙන් හෝ සුරක්ෂිතව පවතින ස්මාරකය වන්නේ මේ පිළිමගෙය යි.එහි ගලින් නෙළන ලද හිටි බුද්ධ ප්‍රතිමාවක් සහ බෝධිසත්ව පිළිම 2 කි. (සැලසුම 01).

ඉහත කී පුරාස්මරක හා පුරාවස්තු මෑත කාලයේ දී අවස්ථා ගණනාවක දීම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි ලෙස හානි සිදුව ඇති බව අප කළගවේශනයෙන් හෙළි විය. 1950 දශකයේ දී සෙනරත් පරණවිතානගේ මූලිකත්වයෙන් නැගෙනහිර පළාත පිළිබඳ ගවේෂණයේ දී නටබුන් ආශ්‍රිත මුහුදු මහා විහාරය ඇතුළත් බිම් කඩ 1951 වසරේ ජනවාරි 26 ගැසට් පත්‍රයෙන් පුරාවිද්‍යා භූමියක් බවට පත් කරන ලදී. අක්කර හැත්තෑ දෙකයි රූඩ් තුනයි පර්චස් දහතුනක් ඒ අනුව මෙම රක්ෂිතයට අයත් විය. මේ ආකාරයට රක්ෂිතයක් බවට නම් කර තිබුණ ද අවිධිමත් ක්‍රියාමාර්ග ඔස්සේ මෙහි පුද්ගල පදිංචි වීම්, නිවාස ඉදිකිරීම් මගින් පුරා ස්ථානයේ භූමි ප්‍රමාණය සීමා වී ඇත. 2012 වර්ෂයේ දී මුස්ලිම් වාර්ගිකයින් පිරිසක් මෙහි පැමිණ වැල්ලට යට ව තිබූ පැරණි චෛත්‍ය ඩෝසර් යන්ත්‍ර යොදා විනාශ කිරීමට උත්සාහ කළ බව තොරතුරු වාර්ථා වේ.

මුහුදු මහා විහාර පුරා පරිශ්‍රය සඳහා එල්ල වී ඇති මානව බලපෑම් සඳහා හේතු මූලික වී ඇත්තේ ආගමික හා ජාතිවාදය ඉස්මතු වීම බව අපගේ පර්යේෂණය තුළින් පැහැදිළි විය. පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමස්ත ජනගහනයෙන් 93%ක් මුස්ලිම් ප්‍රජාව වන හෙයින් ද ඔවුන් දෘඪ ඉස්ලාම් භක්තිකයන් වන හෙයින් ද මෙම ගැටලුව වඩාත් සංකීර්ණ තත්වයට පත්ව ඇති බව පෙනෙයි. මෙකී මුස්ලිම් ප්‍රජාව කල්පනා කරනු ලබන්නේ මෙම




මූලාශ්‍රය : 2015 පුරාවිද්‍යා ගවේශනය

සැලසුම අංක 1: පිළිමගෙය බිම් සැලසුම

විහාරස්ථානය හා පුරා පරිශ්‍රය ඔවුන්ගේ අභිමතයන්ට බාධාවක් වන බවයි. බෞද්ධ සංස්කෘතිය පිළිබිඹු වන මෙකී පුරාවස්තු තම උරුමයක් ලෙස රැක ගැනීමට බෞද්ධ සුළුතරය වෑයම් කරයි. අතීතය විසින් උරුම කරනු ලැබූ සංස්කෘතික වටිනාකමක් සහිත පුරාවස්තු හා පුරා ස්මාරක එක් ජාතියකට පොදු වූ උරුමයක් නොවේ. එය සමස්ත ලංකාවාසීන්ගේ ජාතික උරුමයකි. මෙම සමීක්ෂණයෙන් පෙනී ගියේ ඔවුන් කරුණු නිසි ආකාරයෙන් තේරුම් නොගැනීම, සාවද්‍ය චින්තනය සහ ඊට අනුකූලව කටයුතු කිරීම හේතු කොට ගෙන මෙම ඓතිහාසික ස්ථානය ඔවුන් විසින් තම වාර්ගික පැවැත්මට අයහපත් ලෙස බලපාන සාධකයක් ලෙස ගෙන ඇති බවය. මෙම ස්ථානය එක් අතකින් පෞරාණික ස්ථානයක් වන අතර අනෙක් පසින් එය සමාජ සංහිඳියාවට හා සහජීවනයට මඟ පෙන්වනු ලබන සංකේතයක් වන්නේය. මෙම කරුණු වටහා ගෙන පටු පරමාර්ථ වලින් ඉවත්ව කටයුතු කිරීමෙන් මුස්ලිම් ප්‍රජාවට ද මෙම පෞරාණික උරුම ස්ථානය යහපත් මානුෂික වාතාවරණයක් ගොඩ නංවන පොදු ස්ථානයක් බවට පත් වනු ඇත. එකී ක්‍රියාමාර්ගයට අවතීර්ණය වනු පිණිස සහ මෙම ජාතික උරුමය රක්ෂාවරණය කර ගැනීම උදෙසා තවත් යෝජනා කිහිපයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. දිගු කාලීන යෝජනා යටතේ, ජාතිය නොව ජාතිකත්වය ස්මතු වන පරිදි හැඳුනුම්පත් සකස් කිරීම, ස්වකීය භාෂාවෙන් සේවාවන් ලබා ගැනීමට පහසු ක්‍රමවේදයක් ආයතන අතර ඇති කිරීම, පාසල් අධ්‍යාපනය මගින් රට තුළ භාවිත වන භාෂාවන් විධිමත්ව ඉගැන්වීමේ ක්‍රමවේදයක් සකස් කිරීම, දේශපාලනය තුළ ජාතිවාදය ඡන්ද ලබා ගැනීමේ අවියක් කර ගැනීම වහා නතර කිරීම ආදී කරුණු ද මුහුදු මහාවිහාර පුරා පරිශ්‍රය සම්බන්ධව කෙටි කාලීන යෝජනා වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මුහුදු මහාවිහාරයට අයත් භූමිය නිවැරදිව වෙන් කර දිය යුතු ය. එම ප්‍රදේශයේ මේ වන විට මුස්ලිම් පවුල් ජීවත් වන්නේ නම් ඔවුන් එම ප්‍රදේශවලින් ඉවත් කර නීත්‍යානුකූල පදනම මත ඔවුන්ට විකල්ප ඉඩම් ලබා දිය යුතු ය. මෙම ප්‍රදේශයේ ක්‍රියාත්මක වන සර්ව ආගමික කමිටු තව දුරටත් අර්ථවත් කිරීම, ආගමික වතාවත් පැවැත්වීම ආදී කටයුතු වලදී එකිනෙකාට බාධාවක් නොවන අයුරින් ක්‍රියා කිරීම ආදිය වේ. මෙවැනි විශේෂ වූ ගැටළු හමුවේ ජාතික උරුමය රැක ගැනීම සඳහා අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතු ව ක්‍රියා කිරීමට සියලු පාර්ශවයන් සතු වගකීමකි.

### ආශ්‍රිත ග්‍රන්ථ

**මහාවංසය,** (1931). හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි හා බටුවන්තුඩාවේ සංස්කරණය (සිංහල), කොළඹ.

ගුණවර්ධන ආර්.ඒ.ඒල්.එච්. (2001), රාජ්‍යයට පෙරාතුව: පුරාතන ශ්‍රී ලංකාවේ දේශපාලන ආයතන පරිණාමයේ මුල් අවධියක්, **ප්‍රවාද අංක** 18, අප්‍රේල්-ජූනි සමාජවිද්‍යාඥයින්ගේ සංගමය, හෝමාගම.

වාච්චගේ, සුමනසිරි (2005). **දුට්ඨගාමණී අභය මහරජ**, කර්තෘ ප්‍රකාශනයකි.

**Culavamsa** (1953) tr. Wilhelm Geiger, translated from the German in to English by C. Mable Rickmers, 2pts Colombo.

Ranawella, S. (1966), A Political History of Rohana from C 991-1253 A.D. Unpublished PhD. Thesis, University of London.